# ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
# தேசிய கொள்வனவு ஆணைக்குழு
# National Procurement Commission

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව - චක්‍රලේඛ අංක 03

මගේ අංකය : NPC/ESTAB/2016/03
2017.04.05

ජනාධිපති ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම්,
ලේකම්,

................................................................ අමාත්‍යාංශය

මහත්මයාණෙනි/මහත්මියනි,

<u>රාජ්‍ය ආයතනයන්හි ප්‍රසම්පාදන ක්‍රියාවලි අධීක්ෂණය කිරීම.</u>

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවීම පිළිබඳව 2016 අප්‍රේල් 27 වන දිනැති අංක 01 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛය වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරන අතර www.nprocom.gov.lk යන අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් එය පරිශීලනය කළ හැකි බවද දන්වමි.

රජයේ ආයතන විසින් සිදු කරනු ලබන භාණ්ඩ සහ සේවා,වැඩ, උපදේශන සේවා සහ තොරතුරු පද්ධති යනාදී සියලුම ප්‍රසම්පාදන, පූර්වයෙන් අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම් අනුකූල ප්‍රසම්පාදන සැලසුම මත පදනම් ව සිදු කරනු ලබන්නේද යන්න අධීක්ෂණය කිරීම 156 ඇ (1) 2(අ ) දරන වගන්තියේ සඳහන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන ප්‍රකාරව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු වන්නේ ය.

ඉහත විධිවිධානයන්ට අනුගත වෙමින්, ඔබගේ අමාත්‍යාංශයට සහ ඔබගේ විෂය පථයට ගැනෙන සියලුම ආයතනයන්ට අදාළ පහත සඳහන් ලිපිලේඛන 2017 අප්‍රේල් මස 28 වන දින හෝ එදිනට පෙර අප වෙත ලැබීමට සලස්වන මෙන් ඉල්ලා සිටිමි.

(අ) 2017 වර්ෂය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්ම

(ආ) 2017 වර්ෂය සඳහා අනුමත ප්‍රසම්පාදන සැලැස්ම

මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

සීතා විතානආරච්චි,
මහ ලේකම්,
ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

පිටපත
1) අමාත්‍ය මණ්ඩල ලේකම්


ගොඩනැගිලි අංක 02, කාමර 2/211, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,කොළඹ 07,
☎ : 011 267 4128, 011 269 1131-34 දිගුව - සභාපති: 161, මහ ලේකම්: 163, අතිරේක මහ ලේකම්: 181

கட்டிட இல 02, அறை 2/211, பண்டாரநாயக்க சர்வதேச மாநாட்டு மண்டபம், கொழும்பு- 07.
☎ : 011 267 4128, 011 2691131-34 நீடிப்பு - தலைவர்: 161, செயலாளர் நாயகம்: 163, மேலதிக செயலாளர் நாயகம்: 181

Block No, 02, Room 2/211, Bandaranaike Memorial International Conference Hall (BMICH), Colombo 07
☎ : 011 267 4128, 011 269 1131-34 Ext - Chairman: 161, Secretary General: 163, Addl. Secretary General: 181